# රහතන් වහන්සේලාගේ චෛත්‍යයට කරන ඡත්‍ර පූජාව ඔබ නිවන් දකින තෙක් දුගතියෙන් මුදවයි

## ඡත්තදායක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 432 - 433)

රහතන් වහන්සේ නමක වූ තම පුතා සොයමින් ගිය කෙනෙක් ඒ රහතන් වහන්සේ පිරිනිවන් පෑ බව දැනගෙන එම සෑය වෙත ගියේය. එසේ ගොස් සෑය වැඳ, ඡත්‍ර (දා ගැබක මුදුනේ සාදන ලද ගල් හෝ ලී කුඩ) පූජාවක් ද කළේය.

එහි ආනිසංස ලෙස කල්ප අනූ හතරකට පසු ගෞතම බුදු සසුනේ පැවිදි ව රහත් බව ලබන තුරු කිසි ම දුගතියක ඉපදුණේ නැත. සක්විති රජ පදවිය ද ලැබුණේය.